# ඔබේ දරුවාගේ පාසලේ ජාතිවාදය හා අසාධාරණය ගැන පැමිණිලි කරන්නේ කෙසේද



Sinhalese

**ඔබේ දරුවාට පාසල් ප්‍රජාව තුළ ගෞරවය, වටිනාකම හා සමානාත්මතාවෙන් යුතුව සැලකුම් ලැබීම සිදු විය යුතුය.**

**ආගම හෝ ජාතිය පදනම් කර ගනිමින් සිදුවන අසාධාරණය හෝ හිංසනය ඉවසිය යුතු නොවේ.**

ඔබ පාසලේ දී ආගම හෝ ජාතිය නිසා අසාධාරණයට හෝ හිංසනයට ලක්වන දරුවෙකුගේ මාපියෙකු හෝ භාරකරුවෙකු නම් ඒ ගැන පැමිණිලි කරන ලෙස අපි ඔබ දිරි ගන්වන්නෙමු.

සුදුසු ක්‍රියාමාර්ග හා උපකාර සිදුවන බව පාසල් කාර්ය මණ්ඩලයට තහවුරු කර ගත හැකිය.

අදාළ සිදුවීම ගැන පාසලට හෝ කලාප කාර්යාලයට විධිමත් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම ද ඔබට සිදු කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා බලන්න:
ඔබේ පාසල ගැන ගැටලුවක් හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න (education.vic.gov.au)

## ජාතිවාදය පිළිබඳ ක්ෂණික දුරකථන අංකයට (REPORT RACISM HOTLINE) සිදුවීමක් වාර්තා කිරීම

**Report Racism Hotline**

1800 722 476

report.racism@education.vic.gov.au

මෙම ක්ෂණික දුරකථන අංකය ප්‍රසිද්ධ නිවාඩු දින හැර සඳුදා සිට සිකුරාදා දක්වා පෙව. 9 සිට පව.5 දක්වා ක්‍රියාත්මක වේ.

දරුවාගේ පාසලට පැමිණිලි කිරීමට ඔබට අපහසුවක් දැනේ නම්, හෝ පාසලෙන් ලැබුණු ප්‍රතිචාරය ගැන ඔබ අසතුටු නම්, ඔබට දෙපාර්තමේන්තුවේ Report Racism ක්ෂණික දුරකථන අංකයට පැමිණිලි කළ හැකිය.

ක්ෂණික දුරකථන අංකයට කතා කිරීමෙන් ඔබට පහත දැක්වෙන දේ සිදු කළ හැකිය:

- පැමිණිල්ලක් ගැන සාකච්ඡා කිරීම
- පවතින විකල්ප ගැන හා ඔබට මීළඟට කල හැක්කේ කුමක් දැයි සලකා බැලීම
- කලාපීය නිලධාරීන් හා උපකාර සේවා සමග සම්බන්ධ වීමට සහාය වීම.

## PARENTLINE තුළින් දුරකථනය ඔස්සේ උපදේශන හා උපකාර ලබා ගත හැකිය

**Parentline**

13 22 89

www.parentline.vic.gov.au

Parentline ප්‍රසිද්ධ නිවාඩු දින ඇතුළුව සතියේ දින 7 දීම පෙව. 8 සිට මධ්‍යම රාත්‍රිය දක්වා ක්‍රියාත්මක වේ.

දෙපාර්තමේන්තුවෙන් ස්වාධීන වූ සුදුසුකම් ලත් උපදේශකයෙකුගෙන් උපදේශන හා උපකාර ලබා ගැනීමට ද ඔබට Parentline ඇමතිය හැකිය.

Parentline යනු උපතේ සිට අවුරුදු 18 දක්වා වන දරුවන්ගේ මාපියන් හා භාරකරුවන් වෙනුවෙන් වන රහසිගත හා නම් අවශ්‍ය නොවන දුරකථනය උපදේශන සේවාවකි.

පාසලේදී සිදුවන අසාධාරණය හා හිංසනය ඇතුළු මාපියන්ට ඇති ගැටලු ගැන කතා කිරීමට උපදේශකයෝ සිටිති.

## ප්‍රයෝජනවත් තොරතුරු

පාසල්වල සිදුවන ආගම හෝ ජාතිය නිසා සිදුවන අසාධාරණය ගැන පැමිණිලි කිරීම සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා බලන්න:
පාසල්වල සිදුවන ආගම හෝ ජාතිය නිසා සිදුවන අසාධාරණය ගැන පැමිණිලි කිරීම (education.vic.gov.au)

ජාතිය නිසා හිරිහැර කිරීම ඇතුළුව හිරිහැර කිරීමට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ වැඩිදුර තොරතුරු හා සම්පත් සඳහා බලන්න:
හිරිහැර නවත්වන්නෝ (education.vic.gov.au)

**ජාතික පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව (TIS)**

භාෂණ පරිවර්තන සේවාව අවශ්‍ය වන මාපියන් හා භාරකරුවන්ට 13 14 50 ඔස්සේ ජාතික පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව (TIS) අමතා දෙපාර්තමේන්තුව හෝ Parentline ඇමතිය හැකිය.

THE EDUCATION STATE

VICTORIA State Government | Education and Training